## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර

01. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2020.11.16 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

02. *සුදුසුකම් :*

(අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට රාජ්‍ය නිලධරයෙකු වශයෙන් අවුරුදු 20කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්;

හෝ

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නීතිඥ වෘත්තියේ අවුරුදු 10කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්.



03. සභාපතිවරයෙකුහට ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ :-

| | | |
|---|---|---|
| මාසික දීමනාව | - | රු. 100,000 |
| ප්‍රවාහන දීමනාව | - | රු. 50,000 (මාසිකව) |
| ඉන්ධන දීමනාව | - | (මාසික) (වෙළඳපොලෙහි පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව ඉන්ධන ලීටර 225 ක දීමනාවක්) |
| දුරකථන දීමනාව | - | රු. 10,000 |

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
කොළඹ 12.

10-399

Source: Government Gazette (2020.10.02)